NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA COLOMBO 10

## ඒකක පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | විද්‍යාව | ඒකකය 18: ස්වාභාවික ආපදා |
|---|---|---|

## I කොටස

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රී ලංකාවට සුළි සුළං අවදානම වැඩිම මාස වන්නේ,

(1). මාර්තු - අප්‍රේල් ය
(2). නොවැම්බර් - දෙසැම්බර් ය
(3). පෙබරවාරි - මාර්තු ය
(4). ඔක්තෝබර් - ජූලි ය

02. සුළි සුළඟක ඇස පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වන්නේ,

(1). සුළි සුළඟේ මැද ඇති කළු පාට වෘත්තයයි
(2). ඇස වටා කළු වලාකුළු සමූහයක් ඇත
(3). ඇස තුළ තද සුළං සහ අධික වැසි පවතී
(4). ඇස යම් ප්‍රදේශයක් පසු කරන විට සුළං නැත

03. සුළං වර්ගයක් නොවන්නේ,

(1). ටයිෆූන් (2). හරිකේන් (3). නිවර්තන වාසුළි (4). නිගඝය

04. භූමි කම්පා පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වන්නේ,

(1). පොළවේ ඇතිවන ප්‍රභල කම්පනයකි
(2). උල්කාපාත වැටීම නිසා හටගනියි
(3). භූ තැටි මායිම් අසල සුලභවේ
(4). භූ තැටි චලනය නිසා සිදුවේ

05. ශ්‍රී ලංකාව පිහිටා ඇති භූ තැටියේ නම,

(1). ඉන්දු භූ තැටිය
(2). ඕස්ට්‍රේලියානු භූ තැටිය
(3). පිලිපීන භූ තැටිය
(4). කැරිබියානු භූ තැටිය

06. භූමි කම්පාවකදී එක් තැටියක් අනෙක් තැටිය යටට ගමන් කිරීම,

(1). අභිසරණ තැටි මායිම ය
(2). අපසරණ තැටි මායිම ය
(3). තීර්යක් තැටි මායිම ය
(4). අන්වායාම තැටි මායිම ය

07. භූමි කම්පාවක ප්‍රබලතාවය මනින උපකරණය වන්නේ,

(1). භූ කම්පන මානය (2). රිච්ටර් මාපකය (3). අනිලමානය (4). තත්පරයට මීටර්

08. සුනාමි සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වන්නේ,

(1). තරංගය ගැඹුරු මුහුදේදී හානිකර නොවේ
(2). තරංගය වෙරළේදී ඉතා උස්ව නැගේ
(3). මුහුදු පතුල නායයාම් නිසා හටගනියි
(4). ගැඹුරු මුහුදේ ඇති යාත්‍රාවලට හානි කරයි

09. සුනාමි ඇතිවීමට හේතුවන භූමි කම්පා හට ගන්නේ,

(1). සාගර පතුලේ ය

(2). තැටි මායිම් තුළ ය

(3). වෙරළ ආසන්නයේ ය

(4). ගොඩබිම කන්තාරවල ය

10. වර්තමානයේ ස්වාභාවික ආපදා බහුල වීමට හේතුව වන්නේ,

(1). ගෝලීය උණුසුම ඉහළයාම ය

(2). හරිතාගාර වායු බහුල වීම ය

(3). වායුගෝලීය දූෂණය

(4). ඉහත සියල්ලම

## II කොටස

01. භූමි කම්පා මගින් මිනිස් ජීවිත හා දේපලවලට විශාල ලෙස හානි සිදුවේ. භූමි කම්පාවලට ප්‍රධාන හේතුව භූ තැටි චලනයයි.

A. i. භූ තැටි පිහිටා ඇත්තේ පෘථිවියේ කුමන ස්ථරයේද?

ii. ඒවා චලනය වීමට හේතුව පහදන්න.

iii. භූ තැටි චලනය වන අකාර 3ක් නම් කරන්න.

iv. භූමි කම්පාවක ප්‍රබලතාවය මනින උපකරණය හා ඒකකය නම් කරන්න.

v. ලෝකයේ වැඩිම භූමි කම්පා ඇතිවන ප්‍රදේශය කුමක්ද?

B. ලැව්ගිනි නිසාද විපත් සිදුවේ.

i. ගින්නක් ඇති වීමට තිබිය යුතු සාධක 3ක් ලියන්න.

ii. ලැව්ගිනි නිසා සිදුවිය හැකි හානිදායක තත්වය කුමක්ද?

02. A. i. නියඟය යනු කුමක්ද?

ii. නියඟයක් සඳහා බලපාන මූලික කරුණු 2ක් සඳහන් කරන්න.

iii. නියඟයක් වර්ධනය වීම සඳහා බලපාන මිනිස් ක්‍රියාකාරකම් 3ක් ලියන්න.

iv. එල්නිනෝ ආවරණය යනු කුමක්ද?

B. i. සුනාමියක පෙර සලකුණු 2ක් සඳහන් කරන්න.

ii. හදිසි විපතකදී රට වැසියා වෙනුවෙන් උදවු කරන මධ්‍යස්ථානය කුමක්ද?

03. මිනිසාට බලපාන ස්වාභාවික ආපදා බොහෝ ඇත. සුළි සුළං එවැනි ආපදාවකි.

A. i. සුළි සුළං ඇතිවන ආකාරය පහදන්න.

ii. සුළි සුළං ඇතිවීමට හේතුවන සාධක 3ක් ලියන්න.

iii. සුළි සුළං නිසා සිදුවිය හැකි හානි 2ක් ලියන්න.

B. භූමි කම්පා නිසා සුනාමි හටගැනීම සිදුවේ.

i. ඒ හැර සුනාමි ඇතිවීමට හේතුවන ස්වාභාවික සිදුවීම් 3ක් ලියන්න.

iii. වෙරළේදී සුනාමි රළ හානිදායක වන්නේ ඇයිදැයි විද්‍යාත්මකව පහදන්න.

04. හිස්තැන් සඳහා සුදුසු වචන වරහන තුළින් තෝරා ලියන්න.

(ඉන්දු-ඕස්ට්‍රේලියා, පැසිෆික්, පීඩන අවපාතයක්, සමකය මත, භූ කම්පන රේඛය, නිවර්තන වාසුළි, නැගෙනහිර, තුනක්, රිච්ටර් පරිමාණය, සුළි සුළං)

i. පෘථිවියට ආසන්න වායුගෝලයේ ඇතිවන අඩු පීඩන ප්‍රදේශයක් තවදුරටත් වර්ධනය වුවහොත් ...................................... බවට පත්වේ.

ii. ...................................... සුළි සුළං ඇති නොවේ.

iii. ශ්‍රී ලංකාවට බලපෑ සුළි සුළං වැඩිපුරට ඇතුළුවී ඇත්තේ ...................................... වෙරළ ප්‍රදේශයෙනි.

iv. පෘථිවියේ සමකයට ආසන්න ප්‍රදේශයට ලැබෙන සූර්ය ශක්තිය ලොව පුරා බෙදාහරින ප්‍රධාන යාන්ත්‍රණය ...................................... ය.

v. ශ්‍රී ලංකාවට බලපාන්නේ ...................................... සුළි සුළං ය.

vi. භූ තැටි මායිම්වලදී එකිනෙකට සාපේක්ෂව භූ තැටි චලනය වන ආකාර ...................................... හඳුනාගෙන ඇත.

vii. වැඩිම භූමි කම්පා සංඛ්‍යාවක් සිදුවී ඇත්තේ ...................................... භූ තැටි මායිම් ප්‍රදේශයේය

viii. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ ...................................... භූ තැටියේය.

ix. භූ කම්පන පිළිබඳ තොරතුරු ස්වයංක්‍රීයව සටහන් කෙරෙන උපකරණය ......................................

x. භූ කම්පන රේඛය මගින් සටහන්වන තොරතුරු සාමාන්‍ය මිනුමක් ලෙස ඉදිරිපත් කිරීම ...................................... මගින් සිදුවේ.